



චන්ද්‍රිකා දත්ත මත පදනම් වූ

# ටූනා මත්ස්‍යය බිම් පුරෝකතන සේවාව
# ஆழ் கடல் மீன்பிடித் தளங்களுக்கான எதிர்வு கூறல்

---

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය

கடல்சார் கடல் அறிவியல் தேசிய நிறுவனம் தேசிய நீர்வள
ஆராய்ச்சி அபிவிருத்தி முகாமை




බහුදින යාත්‍රා සඳහා මසුන් ගැවසෙන ප්‍රදේශ පිළිබඳ පුරෝකථනය

# ஆழ் கடல் மீன்பிடித் தளங்களுக்கான எதிர்வு கூறல்

නිකුත්කල දිනය பிரசுரிக்கப்பட்ட திகதி :

**2023-02-01**

| දේශාංශ நெட்டாங்கு | | | අක්ෂාංශ அகலாங்கு | | | ගැඹුර ஆழம் |
|---|---|---|---|---|---|---|
| අංශක பாகை | මිනිත්තු கலை | | අංශක பாகை | මිනිත්තු கலை | | බඹ பாகம் |
| 62 | 23 | E | 0 | 20 | N | 26 |
| 68 | 18 | E | 0 | 23 | N | 34 |
| 68 | 58 | E | 0 | 35 | N | 36 |
| 87 | 0 | E | 3 | 39 | N | 49 |
| 86 | 42 | E | 2 | 41 | N | 52 |
| 85 | 43 | E | 2 | 39 | N | 51 |
| 86 | 19 | E | 1 | 35 | N | 54 |
| 89 | 43 | E | 4 | 19 | N | 38 |
| 63 | 37 | E | 4 | 19 | N | 34 |
| 68 | 19 | E | 9 | 32 | N | 43 |
| 69 | 1 | E | 8 | 22 | N | 49 |
| 68 | 58 | E | 0 | 49 | N | 36 |
| 80 | 1 | E | 2 | 58 | N | 54 |
| 77 | 20 | E | -4 | 39 | S | 34 |
| 64 | 4 | E | -1 | 21 | S | 33 |
| 65 | 26 | E | -3 | 40 | S | 29 |
| 81 | 5 | E | -4 | 0 | S | 49 |
| 89 | 6 | E | -7 | 57 | S | 29 |
| 67 | 56 | E | -2 | 59 | S | 35 |
| 68 | 17 | E | -1 | 44 | S | 35 |

Service credits: "Generated using E.U. Copernicus Marine Service Information. GMI data are produced by Remote Sensing Systems and sponsored by NASA Earth Science funding

<u>බහු දින යාත්‍රා සඳහා කාලගුණ අනාවැකිය</u>
<u>උතුරු අක්ෂාංශ 20 ත් දකුණු අක්ෂාංශ 10 ත් සහ නැගෙනහිර දේශාංශ 60 ත් 100 ත් අතර මුහුදු ප්‍රදේශය සඳහා</u>
**<u>(2023 පෙබරවාරි මස 01 දින පෙ.ව. 07.00 ට, ඉදිරි පැය 24 සඳහා නිකුත් කරන ලදි.)</u>**

<u>දිවයින වටා වන මුහුදු ප්‍රදේශ</u>

**නිරිත දිග බෙංගාල බොක්ක ආශ්‍රිත පීඩන අවපාතය ඊයේ රාත්‍රියේ ත්‍රිකුණාමලයට කිලෝමීටර් 180 ක් පමණ නැගෙනහිර දෙසින් අක්ෂාංශ 8.4°N සහ දේශාංශ 82.9°E ආසන්නයේ කේන්ද්‍රගතව පැවතිණි. එය ක්‍රමයෙන් බටහිර දෙසට බරව නිරිත දෙසට ගමන් කරමින් 2023 පෙබරවාරි 01 (අද) පෙරවරුවේදී ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරය වෙතට ළඟා වෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.**

**දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවික කටයුතුවල නොයෙදන ලෙස දැනුම් දෙනු ලැබේ.**

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස ධීවර හා නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**

**වැසි තත්ත්වය:**

දිවයිනවටා වන මුහුදු ප්‍රදේශ විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

**සුළඟ:**
සුළං ඊසාන දෙසින් හමා එන අතර සුළගේ වේගය පැ.කි.මී. (30-40) පමණ වන අතර පොතුවිල් සිට මඩකලපුව, ත්‍රිකුණාමලය, කන්කසන්තුරය සහ මන්නාරම හරහා පුත්තලම දක්වා වන මුහුදු ප්‍රදේශයේ සුළගේ වේගය විටින් විට **පැ.කි.මී. (55-60)** දක්වා වැඩි විය හැක.
**මුහුදේ ස්වභාවය:**
පොතුවිල් සිට මඩකළපුව, ත්‍රිකුණාමලය සහ කන්කසන්තුරය හරහා මන්නාරම දක්වා වන මුහුදු ප්‍රදේශයේ **මුහුදු රළ උස මීටර් (2.5–3.0) ක් පමණ** ඉහළ යාමේ හැකියාවක් ද පවතී. එබැවින් එම මුහුදු ප්‍රදේශය රළු වන අතර විටින් විට ඉතා රළු වේ. දිවයිනවටා වන මුහුදු ප්‍රදේශ තරමක් රළු වේ.

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

<u>බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය</u>

**නිරිත දිග බෙංගාල බොක්ක ආශ්‍රිත පීඩන අවපාතය ඊයේ රාත්‍රියේ ත්‍රිකුණාමලයට කිලෝමීටර් 180 ක් පමණ නැගෙනහිර දෙසින් අක්ෂාංශ 8.4°N සහ දේශාංශ 82.9°E ආසන්නයේ කේන්ද්‍රගතව පැවතිණි. එය ක්‍රමයෙන් බටහිර දෙසට බරව නිරිත දෙසට ගමන් කරමින් 2023 පෙබරවාරි 01 (අද) පෙරවරුවේදී ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරය වෙතට ළඟා වෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.**

**දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවික කටයුතුවල නොයෙදන ලෙස දැනුම් දෙනු ලැබේ.**

**ගිනිකොනදිග සහ නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශ සඳහා :**
**උතුරු අක්ෂාංශ 05 ත් 12ත් සහ නැගෙනහිර දේශාංශ 78 සහ 88 ත් අතර මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය පැ.කි.මී. (30-50) පමණ වන අතර විටින් විට පැ.කි.මී. (60-70) දක්වා වැඩිවිය හැක. ඉහත කී මුහුදු ප්‍රදේශ ඉතා රළු හෝ රළු වන අතර තද වැසි හෝ ගිගුරුම් සහිත වැසිද ඇතිවිය හැක. එබැවින්, ඉහත සඳහන් මුහුදු ප්‍රදේශයට පෙබරවාරි මස 02දින දක්වා යාත්‍රා නොකරන ලෙස ධීවර සහ නාවික ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.**

**කාලගුණික තත්ත්වය:**

| | |
|---|---|
| 05N - 15N, 80E-85E | : බොහෝ ස්ථානවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| EQ- 15N, 85E-100E | : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : ප්‍රධාන වශයෙන් වැසි රහිත. |

**සුළං තත්ත්වය:**

| | |
|---|---|
| 05N-15N, 80E-85E | : වාමාවර්තව / පැ.කි.මී. (35-45) ; විටින් විට පැ.කි.මී. (50-60) දක්වා. |
| 15N-20N, 80E-100E | : ඊසාන දෙසින් / පැ.කි.මී. (30-40). |
| සෙසු මුහුදු ප්‍රදේශ | : නැගෙනහිර දෙසින් / පැ.කි.මී. (15-20). |

**මුහුදේ ස්වභාවය:**

05N-15N, 80E-85E : තරමක් රළු, විටින් විට රළු සිට ඉතා රළු දක්වා.
15N-20N, 80E-100E : මඳ වශයෙන් රළු, විටින් විට තරමක් රළු.
සෙසු මුහුදු ප්‍රදේශ : මඳ වශයෙන් රළු.

<u>අරාබි මුහුද</u>

**කාලගුණික තත්ත්වය:**

EQ -05N, 65E-80E : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි
සෙසු මුහුදු ප්‍රදේශ : ප්‍රධාන වශයෙන් වැසි රහිත.

**සුළං තත්ත්වය:**

EQ -20N, 60E-77E: උතුරු දිශාවේ සිට වයඹ දක්වා දිශාවලින් / පැ.කි.මී. (20-30).
EQ -20N, 77E-80E: උතුරු දෙසින් / පැ.කි.මී. (30-40); විටින් විට පැ.කි.මී. (50-60) දක්වා.

**මුහුදේ ස්වභාවය**

EQ -20N, 60E-77E: තරමක් රළු, විටින් විට රළු.
EQ -20N, 77E-80E : විටින් විට රළු සිට ඉතා රළු දක්වා

<u>දකුණු ඉන්දියානු සාගරය</u>

**කාලගුණික තත්ත්වය**:

EQ-07S, 60E-100E : බොහෝ ස්ථානවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.


**සුළං තත්ත්වය:**

වයඹ සිට බස්නාහිර දක්වා දිශාවලින් / පැ.කි.මී. (35-45) ; විටින් විට පැ.කි.මී. (50-60) දක්වා.

**මුහුදේ ස්වභාවය:**

තරමක් රළු, විටින් විට රළු සිට ඉතා රළු දක්වා.

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට තද සුළං සමඟ එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක**.**



කාලගුණ විද්‍යාඥ
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව